# 23 පාඩම - සාහිත්‍ය නිර්මාණ විචාරය

- **ඉගනුම් ඵල :-**
    - නියමිත පාඩම කියවයි.
    - නිර්මාණය හා විචාරය යන්න වෙන් වෙන් ව හඳුනා ගනියි.
    - විවිධ සාහිත්‍ය නිර්මාණයන් කියවා විචාරයේ යෙදෙයි.
    - නියම කරන ලද සාහිත්‍ය නිර්මාණයන් රසවින්දනයේ යෙදෙයි.

1. පෙළ පොතේ 23 වන පාඩම කියවන්න.
2. නිර්මාණය පිළිබඳව අදහස් දක්වයි.
3. විවිධ සාහිත්‍ය නිර්මාණයන් කියවා විචාරයේ යෙදෙන්න.
4. නිර්මාණ කරුවා හා විචාරකයා සතු වගකීම හඳුනාගෙන ඉදිරිපත් කරන්න.
5. සාහිත්‍ය විචාරය පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න.

- **ඉහත කාර්යයන් සඳහා භාවිත කළ හැකි ඉගෙනුම් ආධාරක :-**
    - eතක්සලාව
    - සාහිත්‍ය විද්‍යාව - මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර
    - සාහිත්‍ය විචාර මූලධර්ම - මහාචාර්ය කුලතිලක කුමාරසිංහ
    - සාහිත්‍ය විචාර ප්‍රදීපිකා - මහාචාර්ය ඒ. වී. සුරවීර

<u>ඇගයීම</u>

❖ පහත සඳහන් ප්‍රකාශ හරි නම් √ ලකුණ ද, වැරදි නම් x ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ ලකුණු කරන්න.

1. නිර්මාණ කරුවන් හා රස විඳින්නන් යනුවෙන් සාහිත්‍ය ක්ෂේත්‍රයේ පිරිස් දෙකකි. (...............)
2. රස විඳින්නෝ නිර්මාණයක රස නීරස භාවය නොහඳුනති. (...............)
3. බස දන්න හැම කෙනෙකුටම යම් තරමින් රස විඳිය හැකිය. (...............)
4. විචාරය යනු රස වින්දනයේ මනා පරිචයක් ඇති අයගේ ප්‍රකාශනය යි. (...............)
5. කවීහු බස සූක්ෂම ලෙස පරිහරණය කරති. (...............)